# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1837/53 – 2013 නොවැම්බර් මස 22 වැනි සිකුරාදා - 2013.11.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**දකුණු පළාතේ පළාත් සභාව**

2013 අංක 01 දරන දකුණු පළාත් සභාවේ බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් 2013.08.13 සම්මත කරන ලදුව 2013.10.31 වැනි දින ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කොට ඇති ඉහත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

ගුස්තිඤ්ඤාවඩු ෂාන් විජයලාල් ද සිල්වා,
ප්‍රධාන අමාත්‍ය මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,
ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන, විදුලිබල,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍ය,
දකුණු පළාත

2013 නොවැම්බර් මස 13 වැනි දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
ඉහළ ඩික්සන් පාර,
ගාල්ල.

**2013 අංක 01 දරන දකුණු පළාත් සභාවේ බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය**

බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරය විධිමත් කිරීම සඳහා ද ඊට ආනුශංගික හෝ සම්බන්ධ වෙනත් කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තියේ විධිවිධාන 1942 අංක 13 දරන බඩු උකස් ගන්නන්ගේ ආඥාපනතේ විධිවිධාන වලට අනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය දකුණු පළාතේ පළාත් සභාවේ 2013 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනක සිට එය ක්‍රියාත්මක වන්නේ ය. (ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## *I* වැනි කොටස

### බඩු උකස් ගන්නන්ගේ කාර්යය

බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යැම ඇතැම් තැනැත්තන්ට තහනම් බව

2. කිසියම් තැනැත්තෙකු :-

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන පුද්ගලයෙකු වන්නේ නම් ; හෝ

(ii) විදේශීය සමාගමක් වන්නේ නම් ; හෝ

(iii) විදේශීය ව්‍යාපාර ආයතනයක් වන්නේ නම්,

නියමිත දිනයේ දී හෝ ඉන් පසු ඒ තැනැත්තා විසින් උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන නොයා යුතු ය. ඒ අනුව ඒ ව්‍යාපාරය කරගෙන යාමට යම් පුද්ගලයෙකුට, විදේශීය සමාගමට හෝ විදේශීය ව්‍යාපාර ආයතනයකට නිකුත් කර තිබුණා වූ ද එකී නියමිත දිනට පෙරාතුවම වූ දිනයෙහි වලංගුව පැවතියා වූ ද යම් බලපත්‍රයක් එකී දිනයේ දී සහ ඉන් පසු අවලංගු ලෙසත් බල රහිත ලෙසත් සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

බඩු උකස් ගන්නෙකුගේ බලපත්‍රය

3. (1) කිසිදු බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යනු ලබන සෑම සාප්පුවක් හෝ ශාඛාවක් වෙනුවෙන්ම ඒ එක් එක් සාප්පුව හෝ ශාඛාව සඳහා ප්‍රධාන ලේකම්වරයා විසින් වෙන් වෙන් වශයෙන් නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නේ නම් මිස, තැනැත්තකු විසින් බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන නොයා යුතු ය.

(2) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති "අ" ආකෘතිය අනුව විය යුතු ය.

(3) සෑම බලපත්‍රයකම දිනය වශයෙන් එය නිකුත් කරන ලද දිනය යෙදිය යුතු අතර, ඉන් පසුව එළඹෙන දෙසැම්බර් මාසයේ තිස් එක වන දින එහි වලංගු භාවය අවසාන වන්නේ ය.

ප්‍රධාන ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව ව්‍යාපාරය පවරා දීම නොකළ යුතු බව

4. 3 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් යම් ව්‍යාපාරයකට අදාළ වේ ද ඒ ව්‍යාපාරය ප්‍රධාන ලේකම්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොලබා එම බලපත්‍රය දරන්නා විසින් වෙන යම් තැනැත්තකුට පවරා නොදිය යුතු ය.

බලපත්‍රයේ පිටපතක් පොලිස් අධිකාරීවරයා වෙත යැවිය යුතු බව

5. ප්‍රධාන ලේකම්වරයා විසින් 3 වැනි වගන්තිය යටතේ නිකුත් කරනු ලබන එකී බලපත්‍රයේ පිටපතක් ඒ බලපත්‍රය අදාළ වන ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ යම් ප්‍රදේශයක් තුළ ද ඒ ප්‍රදේශය භාරව සිටින පොලිස් අධිකාරීවරයා විසින් අදාළ කොට්ඨාසයේ පොලිස් ස්ථානාධිපතිවරයා වෙත පිටපතක් යැවිය යුතු ය.

බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම

6. (1) බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යැම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම තැනැත්තකුම විසින් ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් පළාතේ ප්‍රධාන ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. කිසියම් බඩු උකස් ගන්නෙකු විසින් එකකට වැඩි සාප්පු ප්‍රමාණයක් හෝ ශාඛාවන් ප්‍රමාණයක බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය පවත්වාගෙන යන විටක ඒ එක් එක් සාප්පුව හෝ ශාඛාව සඳහා වෙන වෙනම ඉල්ලුම්පත්‍ර ප්‍රධාන ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම නියමිත ලියාපදිංචි ගාස්තු ගෙවා ලියාපදිංචි කරවා ගත යුතු ය.

(3) තවද, මෙම බලපත්‍ර ගාස්තුව මුදල් විෂය භාර ඇමතිවරයා විසින් රජයේ ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් කලින් කලට වෙනස් කනු ලැබිය හැක.

(4) වාර්ෂික බලපත්‍රය නියමිත දිනට අලුත් කිරීම පැහැර හැර බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබූ උකස් ගන්නකු වෙත වාර්ෂික බලපත්‍රය නිකුත් කරන්නේ නම් බලපත්‍රයක් නොමැතිව බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය පවත්වාගෙන ගිය සෑම වර්ෂයක් සඳහා ම, අදාළ බලපත්‍ර ගාස්තු ව ද, බලපත්‍ර රහිතව ව්‍යාපාරය පවත්වාගෙන ගිය සෑම මාසයක් සඳහාම 10% බැගින් වූ ප්‍රමාද ගාස්තුවක් ද අය කළ යුතු ය.

(5) ඉල්ලුම්කරු විසින් තමා බලපත්‍රය නිකුත් කිරීමට පෙර යම් නීති විරෝධි හෝ අනීතික ක්‍රියාවක් සිදු කර නැති බවට දිවුරුම් ප්‍රකාශයක් මගින් තහවුරු කළ යුතු ය.

ඇතැම් තැනැත්තන්ට බලපත්‍ර නිකුත් කිරීම තහනම් කිරීම

7. 2 වැනි වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම හේතුකොට ගෙන උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යාම තහනම්වන යම් තැනැත්තකුට බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා වූ බලපත්‍රයක් නියමිත දිනයේ දී හෝ ඉන් පසු නිකුත් නොකළ යුතු අතර, නොඑසේම එයින් යම් තැනැත්තකු වෙත නිකුත් කරන ලද යම් බලපත්‍රයක් ඒ අනුව ශූන්‍ය හා බල රහිත ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම

8. (1) (අ) යම් තැනැත්තකු බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරන ලෙසට ඉල්ලීමක් කරන දිනයට පෙරාතුවම වූ අවුරුදු පහ තුළ කවර හෝ අවස්ථාවක දී දණ්ඩ නීති සංග්‍රහයේ XI, XIII, XVII හෝ XVIII වන පරිච්ඡේද යටතේ හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ හෝ දඬුවම් පැමිණවිය හැකි යම් වරදකට වරදකරු කරනු ලැබ ඇත්නම් ; හෝ

(ආ) 46 (2) වගන්තියේ ප්‍රකාර වාර්ෂික ගිණුම් ප්‍රකාශය ඉදිරිපත් නොකරනු ලබන තැනැත්තෙකුට

බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යෑම සඳහා වූ බලපත්‍රයක් එම තැනැත්තා වෙත නිකුත් නොකළ යුතු ය.

බලපත්‍රය අළුත් කිරීම

9. 3 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන යම් තැනැත්තකු එම බලපත්‍රය අළුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ අවස්ථාවක, ඒ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කිරීමට පෙරාතුව යම් කාලසීමාවක් තුළ බලපත්‍රධාරියා විසින් බඩු උකස් ගන්නකු වශයෙන් ස්වකීය ව්‍යාපාරය සම්බන්ධව මේ ප්‍රඥප්තියේ විධිවිධානවල අරමුණු වලට පටහැනි ක්‍රියාවන්හි යෙදී ඇති බවට ප්‍රධාන ලේකම්වරයා සෑහීමකට පත්වන්නේ නම් ඒ බලපත්‍රය අළුත් කිරීම ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය. එසේ කරන අවස්ථාවක දී ඊට හේතු දින 30ක් ඇතුළත එම තැනැත්තාට ලිඛිතව දැනුම් දිය යුතු ය.

අභියාචනා

10. (1) බලපත්‍රයක් අවලංගු කිරීම නිසා හෝ අළුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම නිසා අතෘප්තියට පත් යම් පාර්ශවයක් විසින් එම තීරණයට විරුද්ධව දින තිහක් තුළ අභියාචනා මණ්ඩලයට අභියාචනා කළ හැක.

(2) එම අභියාචනා මණ්ඩලය ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලබන විශ්‍රාමලත් විනිසුරුවරයන් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර ඇප තැබිය යුතු බව.

11. ප්‍රධාන ලේකම් විසින් නියම කරනු ලබන රුපියල් ලක්ෂයක මුදලකට මුදලින් ඇප නොතබන කිසිදු තැනැත්තකු වෙත බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා වූ බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

බලපත්‍රලාභී ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින විට ඒ බව දැන්වීම

12. මාස (03) තුනකට වැඩි යම් කාලයක් ශ්‍රී ලංකාවෙන් පිටත සිටීමට අදහස් කරන සෑම බඩු උකස් ගන්නකුම විසින් :-

(අ) ඒ බව ප්‍රධාන ලේකම්වරයාට ලිඛිතව දැනුම් දිය යුතු ය. තව ද,

(ආ) තමා ශ්‍රී ලංකාවෙන් පිටත සිටින කාලය තුළ තමා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳාහ (බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යෑම සඳහා මේ ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් ඇති තැනැත්තකු වන ) තැනැත්තකු පත් කළ යුතු අතර, එසේ පත් කරන ලද තැනැත්තාගේ නම ප්‍රධාන ලේකම්වරයාට ලිඛිතව දැනුම් දිය යුතු ය.

**ව්‍යාපාර කටයුතු කළයුතු වේලාව**

13. කවර දිනක වුවද පෙරවරු 8ට පෙර හෝ පස්වරු 8ට පසු හෝ කිසිම බඩුවක් උකසට ගැනීම කිසිම බඩු උකස් ගන්නකු විසින් නොකළ යුතු ය.

**බඩු උකස් ගන්නකු වෙන්දේසිකරුවකු වශයෙන් ක්‍රියා නොකළ යුතු බව**

14. වෙන්දේසිකරුවකු වශයෙන් ක්‍රියා කිරීම හෝ වෙන්දේසිකරුවකුගේ ව්‍යාපාරය කරගෙන යාම හෝ කිසිම බඩු උකස් ගන්නකු විසින් නොකළ යුතු ය.

**බඩු උකස් ගන්නන් විසින් දැන්වීම් ආදිය ප්‍රදර්ශනය කර තැබිය යුතු බව**

15. සෑම බඩු උකස් ගන්නකු විසින්ම-

(අ) තම ව්‍යාපාර ස්ථානයේ හෝ පිවිසෙන දොරටුව අසල පැහැදිලිව පෙනෙන අකුරෙන් තම නම සහ "බඩු උකස් ගන්නා" යන වචන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම ලියා සෑම වේලාවකදීම ප්‍රදර්ශනය කර තැබිය යුතු ය. තව ද,

(ආ) ව්‍යාපාර ස්ථානයට පැමිණෙන සෑම තැනැත්තෙකුටම පැහැදිලිව පෙනෙන පරිදි හා ඒ සෑම තැනැත්තකුම විසින් කියවිය හැකි වන පරිදි, මෙහි තුන්වන උපලේඛනයේ දක්වා ඇති විස්තර අඩංගු දැන්වීමක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම ඒ ව්‍යාපාර ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක සෑම වේලේම ප්‍රදර්ශණය කර තැබිය යුතු ය.

**විස්තර ඇතුළත් කිරීම සඳහා භාවිතා කළයුතු භාෂාව**

16. යම් පොතක, ආකෘති පත්‍රයක හෝ ලේඛනයක යම් විස්තර ඇතුළත් කිරීමට මේ ප්‍රඥප්තියෙන් නියම කර ඇති අවස්ථාවක, ඒ විස්තර සිංහලෙන් හෝ දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් ඇතුළත් කළ යුතු ය.

**බඩු උකස් ගන්නන් විසින් පවත්වාගෙන යා යුතු පොත්**

17. මෙහි දෙවන උපලේඛනයේ දක්වා ඇති "අ" ආකෘතිය අනුව වූ උකස්කර පොතක් හා "ආ'' ආකෘතිය අනුව වූ උකස් භාණ්ඩ විකුණුම් පොතක් සෑම බඩු උකස් ගන්නකුම විසින් පවත්වාගෙන යා යුතු වේ. තවද ඇතුළත් කිරීමට ඒ ආකෘතිවල විධිවිධාන සලස්වා ඇති සියළු විස්තර මනා ලෙසත්, පැහැදිලි ලෙසත් ඇතුළත් කළ යුතු අතර ඒ කාර්ය සඳහා අවශ්‍ය සියළු විමසීම් ද ඔහු විසින් කළ යුතු ය.

**උකස් තුණ්ඩු**

18. (1) සෑම උකස් තුණුඩුවක්ම මෙහි දෙවන උපලේඛනයේ "ඇ" ආකෘතියෙහි දක්වා ඇති පරිදි මුල් පත්‍රිකාවකින් හා උපපත්‍රිකාවකින් යුක්තව ද එම ආකෘතියෙහි ඇතුළත් නියමයන්ට අනුකූලව ද ලියා අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) දෙවන උපලේඛණයේ සඳහන් විස්තර සෑම උකස් තුණ්ඩුවකම මුල් පිටපතේ පසු පිටෙහි සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් කියවිය හැකි සේ මුද්‍රණය කර තිබිය යුතු ය.

(3) උකස් භාණ්ඩයක් රුපියල් දහසකට හෝ ඊට වැඩි මුදලකට හෝ උකස් කරනු ලබන අවස්ථාවක ඒ භාණ්ඩයට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාවට මුදලේ වටිනාකමට නියමිත මුද්දර ඇලවිය යුතු ය. ඒ මුද්දරය සැපයීම සඳහා යන වියදම බඩු උකස් ගන්නා විසින් දැරිය යුතු ය.

(4) (අ) බඩු උකස් කරන්නා විසින් උකස් තුණ්ඩුවේ උපපත්‍රිකාව අත්සන් කළහොත් මිස, සහ අත්සන් කරන තෙක් ද,

(ආ) බඩු උකස් ගන්නා විසින් උකස් තුණ්ඩුවේ උපපත්‍රිකාව අත්සන් කොට, එය බඩු උකස් කරන්නාට දුනහොත් සහ දෙන තෙක් ද,

(ඇ) බඩු උකස් ගන්නා විසින් උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව බඩු උකස් ගන්නාගෙන් ලබා ගෙත ඔහු එය පිළිගතහොත් මිස සහ පිළිගන්නා තෙක් ද,

කිසිම බඩුවක් උකස් නොගත යුතු අතර, උකසට ගත්තාක් මෙන් නොසැළකිය යුතු ය.

**පොළී ප්‍රමාණය**

19. කිසිම බඩු උකස් ගන්නකු විසින් උකස්කරුවන් මත දෙනු ලබන ණයක් වෙනුවෙන් තුන්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණය ඉක්මවන පොළියක් අය නොකළ යුතු ය.

එසේ වුව ද, යම් භාණ්ඩයක් මත දෙනු ලබන ණයක් වෙනුවෙන් අදාළ බද්දක් ගෙවිය යුතු වන අවස්ථාවක බඩු උකස් ගන්නා විසින් එම බද්ද බඩු උකස් කරන්නාගෙන් අයකර ගැනීම, මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවල ඇතුළත් කිසිවකින් තහනම් කෙරෙන ලෙස නොසැළකිය යුතු ය.

මෙම වගන්තියේ "උකස් භාණ්ඩය" යන්නට උකස් කරන ලද්දාවූ ද, නියමිත දිනයට පෙර නිදහස් නොකරන ලද්දා වූ ද භාණ්ඩයක් ඇතුළත් වේ.

## II වැනි කොටස

### උකසට යටත් භාණ්ඩ

වර්ෂයක් තුළ දී උකසට යටත් භාණ්ඩ නිදහස් කළ යුතු බව

20. සෑම භාණ්ඩයක්ම එය උකස් දරන ලද දින සිට එළඹෙන දොළොස් මාසයක (මේ ප්‍රඥප්තියේ මින් මතු "නිදහස් කර ගැනීමේ කාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කාලය තුළ දී නිදහස් කරගනු ලැබිය යුතු වන්නේ ය. උකස් කළ දිනය අතහැර මේ කාලය ගණන් බලනු ලැබිය යුතු ය.

උකසට යටත් භාණ්ඩ නිදහස් කරගනු ලැබිය හැකි බව

21. මේ ප්‍රඥප්තියේ අන් තැනක මේ සම්බන්ධයෙන් කුමක් සඳහන්ව ඇත් ද, සෑම උකසට යටත් භාණ්ඩයක්ම, එය නිදහස් කළ යුතු කාල සීමාව ඉකුත්ව ගොස් තිබුණේ වුව ද, මේ ප්‍රඥප්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට එය බැහැර කරනු ලබන තෙක් නිදහස් කර ගනු ලැබිය හැකි වන්නේ ය.

උකස් භාණ්ඩ නිදහස් කර ගැනීමේ ක්‍රියාමාර්ගය

22. (1) යම් උකස් භාණ්ඩයකට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව බඩු උකස් කරන්නා විසින් බඩු උකස්ගන්නාට භාර දී, බඩු උකස් ගන්නා හෝ ඔහුගේ නියෝජිතයා හෝ සේවකයා ඉදිරියේ දී එම මුල් පත්‍රිකාව අත්සන් කොට, තම අනන්‍යතාවය ඔප්පු කළහොත් එම භාණ්ඩය නිදහස් කර ගැනීමේ හිමිකම එම උකස්කරුට ඇත්තේ ය.

(2) බඩු උකස් කරන්නා නොවන යම් තැනැත්තකු විසින් යම් උකස් භාණ්ඩයකට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව ඒ උකස් බඩුව උකස් කළ තැනැත්තාගේ අත්සනින් යථා පරිදි පිටසන් කරවා ගෙන එම මුල් පත්‍රිකාව බඩු උකස්ගන්නා වෙත ඉදිරිපත් කළහොත් සහ ඒ තැනැත්තා විසින් බඩු උකස්ගන්නා, ඔහුගේ නියෝජිතයා හෝ සේවකයා ඉදිරියේ දී එම මුල් පත්‍රිකාව අත්සන් කළහොත් සහ තම අනන්‍යතාව ඔප්පු කර සිටියහොත් එම උකස් බඩුව නිදහස් කර ගැනීමේ හිමිකම ඒ තැනැත්තාට ඇත්තේ ය.

(3) බඩු උකස් කරන්නාගේ මරණය නිසා හෝ ඔහුගේ නෛතික නොහැකියාව නිසා හෝ එම භාණ්ඩය නිදහස් කර ගැනීමේ හිමිකම තමාට ඇතැයි එම භාණ්ඩය අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව දරන (මේ වගන්තියේ මින් මතු "දරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තා විසින් කියා සිටින්නා වූ ද එහෙත් බඩු උකස් කරන්නාගේ අත්සනින් යථා පරිදි පිටසන් කරවා ගෙන උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව බඩු උකස් ගන්නා වෙත ඉදිරිපත් කිරීමට ඔහුට නොහැකි වන්නා වූ ද, අවස්ථාවක එකී දරන්නා විසින් මෙහි දෙවන උපලේඛණයේ "ඇ" ආකෘතිය අනුව සාමදාන විනිශ්චයකාරවරයකු ඉදිරියේ දී යථා පරිදි කරන ලද ප්‍රකාශයක් ද සමග උකස් භාණ්ඩයට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව එකී දරන්නා විසින් බඩු උකස් ගන්නා වෙත ඉදිරිපත් කළ හොත් ඒ උකස් භාණ්ඩ නිදහස් කර ගැනීමට බඩු උකස්ගන්නා විසින් ඉඩ දිය යුතු ය.

(4) (1) වන (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන වලට යටත්ව උකස් භාණ්ඩය මත ගෙවිය යුතු ණය සහ ඊට අයවිය යුතු පොළිය ද, ඒ ණය වෙනුවෙන් ගෙවිය යුතු යම් බද්දක් හෝ උකස් තුණ්ඩුව ඉදිරිපත් කරන බඩු උකස්කරන්නා වෙත හෝ එම තුණ්ඩුව දරන්නා වෙත එම භාණ්ඩය භාරදිය යුතු ය.

එසේ වුව ද උකස් තුණ්ඩුව දරන්නා එය සොරකම් කර හෝ අන්‍යාකාරයකින් නීති විරෝධීව එහි සන්තකය ලබාගෙන ගොස් ඇති බව සැක කිරීමට බඩු උකස් ගන්නාට හේතු ඇත්නම් බඩු උකස් ගන්නා විසින් හැකිතාක් ඉක්මණින් පොලිස් නිලධරයකුට හෝ ග්‍රාම නිලධාරීයකුට දැන්විය යුතු ය.

උකස් භාණ්ඩයේ අගය සෙවීම සම්බන්ධයෙන් වන්දි

23. උකස් භාණ්ඩයක් බේරාගැනීමට හිමිකම ඇත්තා වූ ද, එය බේරාගැනීමට ඉදිරිපත් වන්නා වූ තැනැත්තෙකු විසින් එම භාණ්ඩය උකස් කරනු ලැබූ අවස්ථාවේ දී එහි පැවති අගය බඩු උකස් ගන්නාගේ වරදක්, නොසැලිකිලිමත් කමක් හෝ ඕනෑකමින්ම කළ විෂම චාර්යාවක් මගින් අඩු වී තිබෙන බව නැතහොත් අඩුවීමට සලස්වා තිබෙන බව පෙනී ගියවිට ඒ බව නිසි අධිකරණ බලය ඇති අධිකරණයකට යොමු කිරීමෙන් වන්දි ලබාගැනීමට බඩු උකස් කරන්නාට හිමිකමක් ඇත.

උකස් තුණ්ඩු නොමැති බඩු අයිතිකරුවන්ට සහ උකස් කරන්නන්ට ආරක්ෂාව සැලසීම

24. (1) තමා යම් භාණ්ඩයක අයිතිකරු බව කියා සිටින, එහෙත් උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව නොදරන යම් තැනැත්තකු විසින් හෝ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව දැරීමට තමාට හිමිකම් තිබේ යැයි ද, එනමුත් එම තුණ්ඩුවේ මුල් පත්‍රිකාව නැති වී, සොරකම් කර, අස්ථානගතවී, විනාශ වී හෝ කිසිවකු වංචනික ලෙස තමාගෙන් ලබා ගෙන ඇතැයි ද කියා සිටින යම් තැනැත්තකු විසින් මෙහි දෙවන උපලේඛනයේ "ඉ" ආකෘතියට අනුව සාමදාන විනිශ්චයකාරවරයකු ඉදිරියේදී තමා ද, තමාගේ අනන්‍යතාව සාක්ෂි දරන තැනැත්තා ද විසින් යථා පරිදි කරනු ලැබූ ප්‍රකාශයක් බඩු උකස් ගන්නා වෙත භාරදෙනු ලැබූ විට, ඒ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව ඒ තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලැබූ කල්හි හිමිවන සියළු අයිතිවාසිකම් හා ප්‍රතිකර්ම ඔහු හා බඩු උකස්ගන්නා ද අතර ඇති වන්නේ ය.

එසේ වුව ද, භාණ්ඩයක් බේරා ගැනීමේ කාර්යය සඳහා ඔහු විසින් උකස් තුණ්ඩුවේ අත්සන් කළ යුතු ය.

(2) ඉහත සඳහන් ප්‍රකාශය, එහි අඩංගු යම් වැදගත් තොරතුරක් සම්බන්ධයෙන් වංචනික හෝ ව්‍යාජ බවට අනුමිත දැන්වීමක් බඩු උකස් ගන්නාට ලැබී නැත්නම්, භාණ්ඩය භාරදීම හෝ එම ප්‍රකාශය අනුව වෙනත් ආකාරයකින් ක්‍රියා කිරිම සම්බන්ධයෙන් වගකීමෙන් බඩු උකස්ගන්නා මෙන් ආරක්ෂා කරනු ලැබේ.

භාණ්ඩය නිදහස් කර ගැනීමෙන් හෝ විකිණීමෙන් පසු උකස් තුණ්ඩු බඩු උකස් ගන්නා විසින් තබා ගත යුතු බව

25. (1) භාණ්ඩයක් නිදහස් කර ගැනීමේ කාර්යය සඳහා උකස් තුණ්ඩුවක මුල් පත්‍රිකාව බඩු උකස්ගන්නා වෙතා භාරදෙනු ලැබූ අවස්ථාවක ඒ භාණ්ඩය නිදහස් කර ගත් දින සිට ගණන් ගනු ලබන මාස 24ක කාලයක් ඉකුත්වන තෙක් බඩු උකස්ගන්නා විසින් ඒ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව හා උප පත්‍රිකාව තමා සන්තකයේ තබා ගත යුතු ය.

(2) භාණ්ඩයට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව භාර නොදී භාණ්ඩය නිදහස් කරගනු ලැබූ අවස්ථාවක, එසේ ඒ භාණ්ඩය නිදහස් කළ දින සිට ගණන් ගනු ලබන මාස 24ක කාලයක් ඉකුත් වන තෙක් ඒ භාණ්ඩයට අදාළ උකස් තුණ්ඩුවේ උපපත්‍රිකාව සහ ඒ නිදහස් කර ගැනීමේ කාර්යය සඳහා 24 වැනි වගන්තිය යටතේ තමා වෙත භාර දෙන ලද ප්‍රකාශය බඩු උකස්ගන්නා විසින් තම සන්තකයේ තබා ගත යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් බඩු උකස්ගන්නෙකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යාම අත්හරින ලද අවස්ථාවක දී ඔහු විසින් තබා ඇති ඇප මුදලින් (1) වැනි උප වගන්තියේ සඳහන් වන්දි ගෙවීම සඳහා යෙදිය යුතු යම් මුදලක් අඩුකර ගෙන ඉතුරු මුදල ඒ බඩු උකස් ගන්නාට ගෙවනු ලැබිය යුතු ය.

බඩු උකස්ගන්නන් විසින් තබා ඇති ඇප මුදල් යෙදවීම හා ආපසු ගෙවීම

26. (1) යම් භාණ්ඩයක් යම් බඩු උකස් ගන්නකු වෙත උකස් කර තිබිය දී නිශ්චිතවම නියමිත යම් තත්ත්වයක් යටතේ ඒ භාණ්ඩය නැති වූ අවස්ථාවක දී ඒ බඩු උකස් ගන්නා විසින් තබා ඇති ඇපය, බඩු උකස් කරන්නාට හෝ ඒ භාණ්ඩය නිදහස් කර ගැනීමට හිමිකම ඇති වෙනත් යම් තැනැත්තකුට හෝ වන්දි ගෙවීම සඳහා, නියමිත ආකාරයට යෙදවිය යුතු ය.

(2) ඉහත (1) උපවගන්තිය යටතේ ගෙවනු ලබන වන්දි මුදල නිසා තබා ඇති ඇප මුදලින් අඩුවන ප්‍රමාණය උකස් ගන්නා විසින් ඇපයක් වශයෙන් නැවත ගෙවිය යුතු ය. එම උපවගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි මුදල තබා ඇති ඇප මුදල ඉක්මවා යන්නේ නම්, එවිට වන්දි ලැබීමට හිමිකම් ලබන අය වෙත ගෙවීම පිණිස එසේ ඉක්මවන මුදල් ප්‍රමාණය සහ නියමිත ඇප මුදල් ප්‍රමාණය යන දෙකම ගෙවිය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් බඩු උකස් ගන්නකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යෑම අත් හරින ලද අවස්ථාවක දී ඔහු විසින් තබා ඇති ඇප මුදලින් (1) වැනි උප වගන්තියේ සඳහන් වන්දි ගෙවීම සඳහා යෙදිය යුතු යම් මුදලක් අඩු කරගෙන ඉතුරු මුදල් ඒ බඩු උකස් ගන්නාට ගෙවනු ලැබිය යුතු ය.

ගින්නක් ඇති වුවහොත් එවිට උකස් ගන්නාගේ බැඳීම

27. (1) ගින්නෙන් හෝ ගින්නක් හේතුකොට ගෙන හෝ උකස් භාණ්ඩයක විනාශ වූ හෝ උකස් භාණ්ඩයකට හානි සිදු වූ අවස්ථාවක, උකස නිදහස් කළ හැකි කාලසීමාව ඇතුළත ඉල්ලා සිටිනු ලැබුවහොත් ණය මුදල සහ පොළිය ද ඒ ණය වෙනුවෙන් ගෙවිය යුතු පිරිවැටුම් බද්දක් හෝ අදාළ වෙනත් බද්දක් වේ නම් එම බද්දද අඩුකර, භාණ්ඩයේ වටිනාකම ගෙවීමට බඩු උකස් ගන්නා බැඳී සිටී.

(2) සෑම බඩු උකස් ගන්නකුම, තමා වෙත උකස් කරනු ලැබ ඇති භාණ්ඩවල සම්පූර්ණ වටිනාකම ආවරණය වන පරිදි තම ව්‍යාපාරය රක්ෂණය කරවා ගත යුතු ය.

28. උකස් භාණ්ඩයක් නිදහස් කරන වේලාවේ දී, බඩු උකස් ගන්නකු වෙත ආපසු ගෙවන ලද ණය මුදල සහ පොළී මුදල ද ඔහු විසින් යම් බද්දක් හෝ අයකර ගන්නා ලදදේ නම් ඒ බද්ද සඳහා දෙවන උපලේඛණයේ "ඊ" ආකෘතිය අනුව වූ ලදුපතක් සෑම බඩු උකස් ගන්නකු විසින්ම නිකුත් කළ යුතු අතර, එම ලදුපතේ පිටපතක් උකස් පොතෙහි සුරක්ෂිතව තබා ගත යුතු ය. බඩු උකස් ගන්නාගේ ලදුපත

29. (1) උකස නිදහස් කළ හැකි කාලසීමාව ඇතුළත නිදහස් කර ගනු නොලබන සෑම භාණ්ඩයක්ම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමෙන් බැහැර කරනු ලැබිය හැකි නමුත්, වෙනත් ආකාරයකින් බැහැර කරනු නොලැබිය යුතු ය. තව ද හතරවන උපලේඛණයේ සඳහන් නියෝග ඒ විකිණීමේදී පිළිපැදිය යුතු ය. භාණ්ඩය වෙන්දේසියේ විකිණිය හැකි බව

(2) (1) උප වගන්තියේ විධිවිධාන යටතේ භාණ්ඩයක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට යන විට ඒ සම්බන්ධයෙන් මාස දෙකකට කලින් ලිඛිතව උකස්කරු දැනුවත් විය යුතු ය. එම භාණ්ඩය උකස්කර ඇත්තේ යම් බඩු උකස්ගන්නෙකු වෙත ද, ඒ බඩු උකස්ගන්නා විසින් එම විකිණීම පැවැත්වීමට නියමිත ස්ථානය ද පිළිබඳ ලිඛිත දැන්වීමක් යටත් පිරිසෙයින් දින විසිඑකකට කලින් ප්‍රධාන ලේකම්වරයා වෙත දැනුම් දී ඊට අවසර ලබා ගත යුතු ය.

30. මේ ප්‍රඥප්තිය යටතේ යම් බඩු උකස් කරන්නකුගේ භාණ්ඩයක් විකිණීමට ඇති අස්ථාවක දී ඒ භාණ්ඩය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා ප්‍රධාන ලේකම්වරයා හෝ බලය පවරන ලද නිලධාරියෙකුගේ අවසරය ඇතුව වෙන්දේසි පවත්වන දිනය සහ ස්ථානය පිළිබඳව දැන්වීමක් එදිනට යටත් පිරිසෙයින් දින දහ හතරකට පෙර බඩු උකස් ගන්නා විසින් ඒ භාණ්ඩය උකස් කළ තැනැත්තාට දිය යුතු ය. විකිණීම පිළිබඳ දැන්වීම

31. මේ ප්‍රඥප්තිය යටතේ භාණ්ඩයක් විකුණනනු ලැබූ සෑම අවස්ථාවක දීම, එම භාණ්ඩය මත දෙන ලද ණය මුදල හා එම භාණ්ඩය විකුණූ දිනය දක්වා එම ණය මුදල වෙනුවෙන් අයවිය යුතු පොළිය ද, ඒ ණය වෙනුවෙන් ගෙවිය යුතු බද්දක් වේ නම් එම බද්දද ඉක්මවන මුදලකට එම භාණ්ඩය විකුණනු ලැබූ විට බඩු උකස් ගන්නා විසින් - අයවිය යුතු පොළිය සහ යම් බද්දක් ඉක්මවන මුදලකට එම භාණ්ඩය විකිණීමක දී කාර්ය පටිපාටිය.

(අ) භාණ්ඩය විකුණනු ලැබූ මුදල, විකිණීම සඳහා දරන ලද වියදම් සහ හිඟ පොළී ගාස්තු අඩුකිරීමෙන් පසු බඩු උකස් කරන්නාගේ බැරට ඇති මුදල් ප්‍රමාණය එම භාණ්ඩය උකස් කල තැනැත්තාට නොපමාව දැනුම් දිය යුතු ය.

තවද,

(ආ) විකිණීමේ දින සිට එක් අවුරුද්දක් ඇතුළත ඉල්ලා සිටිනු ලැබුවහොත්, බඩු උකස් කරන්නාගේ බැරට ඇති මුදල එම භාණ්ඩයේ අදාළ උකස් තුණ්ඩුව දරන තැනැත්තාට ගෙවිය යුතු ය. තව ද,

(ඇ) එකී එක් අවුරුද්දක කාල සීමාව තුළ එවැනි ඉල්ලීමක් කරනු නොලැබුවහොත් ඒ කාල සීමාව ඉකුත් වූ වහාම බඩු උකස් කරන්නාගේ බැරට ඇති මුදල බඩු උකස් කරන්නාගේ බැරට පළාත් සභා අරමුදලෙහි තැන්පත් කළ යුතු ය.

32. රුපියල් දහසකට වඩා වැඩි මුදලකට උකස් තබා තිබුණු භාණ්ඩයක් ඒ සඳහා දී තිබුණු ණය මුදල හා විකුණන දිනය දක්වා ඊට අයවිය යුතු පොළිය ද ඉක්මවන මුදලට, තත්කාලයේ බලපවත්නා නීති යටතේ නියමිත දිනට පෙර විකුණා ඇත්තා වූ ද, බඩු උකස් කරන්නාගේ බැරට ඇති මුදල සඳහා ඉල්ලීමක් ඒ භාණ්ඩයට අදාළ උකස් තුණ්ඩුව දරන්නා විසින් එකී විකිණීමේ දිනයෙන් පසු අවුරුද්දක් තුළ දී බඩු උකස් ගන්නා වෙත ඉදිරිපත් කර නැත්තා වූ ද, විටක සහ නියමිත දිනයේ දී හෝ ඉන් පසුව හෝ එකී අවුරුද්දක කාලය ඉකුත් වීම සිදුවන සෑම අවස්ථාවක දීම ඒ කාලය ඉකුත් වූ වහාම බඩු උකස් ගන්නා විසින් එම මුදල එකී බඩු උකස් කරන්නාගේ බැරට පළාත් සභා අරමුදලෙහි තැන්පත් කළ යුතු වේ. නියමිත දිනයට පෙර අයවිය යුතු මුදල හා පොළිය ඉක්මවන මුදලකට විකිණීමක දී කාර්ය පටිපාටිය.

33. 29, 30 හෝ 31 වැනි වගන්ති යටතේ යවනු ලබන සෑම දැන්වීමක්ම, භාණ්ඩ පොතෙහි ඇතුළත් කර තිබෙන ලිපිනයට බඩු උකස් කරන්නා වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු අතර ලියාපදිංචි කිරීමේ ගාස්තුව බඩු උකස් කරන්නා විසින් දැරිය යුතු ය. 29, 30 සහ 31 වැනි වගන්ති යටතේ දැනුම් දීමේ පිළිවෙල

34. බඩු උකස් ගන්නකු වෙත උකස් කර තිබූ භාණ්ඩයක් මේ ප්‍රඥප්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියක දී, ඒ උකස් ගන්නා විසින් ලංසු තබා මිලට ගනු ලැබූ පසු ඔහු ඒ මිලට ගන්නා ලද භාණ්ඩයෙහි අයිතිකරු ලෙස සලකනු ලැබේ. බඩු උකස් ගන්නා විසින් භාණ්ඩ මිලට ගැනීම

## III වැනි කොටස

### පරීක්ෂාව, පරීක්ෂණය සහ තහනමට අල්ලා ගැනීම

විකුණුම් පොත් පරීක්ෂා කිරීමේ බලය

35. භාණ්ඩයක් මේ ප්‍රඥප්තිය යටතේ විකුණන ලද දින සිට අවුරුදු දෙකක් ඇතුළත කවර විටක වුව ද, බඩු උකස් ගන්නාගේ පොතෙහි අත්සන යොදා සහතික කරන ලද ඒ වෙන්දේසිය පිළිබඳ තොරතුරු ඇතුළත් කළ නාමාවලියෙහි සටහන් උකස් තුණ්ඩුව දරන්නා විසින් පරීක්ෂා කළ හැකි අතර, ඒ විකිණීම සම්බන්ධයෙන් ඒ පොතෙහි හෝ නාමාවලියෙහි සටහන් පරීක්ෂා කිරීමට බඩු උකස්ගන්නා විසින් ඒ උකස් තුණ්ඩුව දරන්නාට අවසර දිය යුතු ය.

උකස් තැබීමට භාණ්ඩ ඉදිරිපත් කරන තැනැත්තන් තමන් ගැන අදාළ විස්තරයක් ඉදිරිපත් කරන විට ගතයුතු ක්‍රියාමාර්ග

36. යම් තැනැත්තකු විසින් -

(අ) උකස් තැබීම සඳහා යම් බඩුවක් උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කරයි ද, එහෙත් තමාට ඒ බඩුව ලැබුණේ කෙසේ ද යන්න පිළිබඳව සතුටුදායක විස්තරයක් කිරීම ප්‍රතික්ෂේප කරයි ද නැතහොත් එවැනි විස්තරයක් කිරීමට අපොහොසත් වේ ද නැතහොත්

(ආ) උකස් තැබීම සඳහා බඩු උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කරන භාණ්ඩයක් තමා අයිතිකරු නම් ඔහුගේ නම හා ලිපිනය පිළිබඳව හෝ වෙනත් තැනැත්තකු නම් එම තැනැත්තාගේ අයිතිකරු නම හා ලිපිනය පිළිබඳ ඕනෑකමින්ම අසත්‍ය තොරතුරු සපයාදුන් නැතහොත්

(ඇ) නිදහස් කර ගැනීමට හිමිකමක් නැති භාණ්ඩයක් නිදහස් කර ගැනීමට උත්සාහ කරන නැතහොත්

(ඈ) යම් බඩුවක් උකස් තැබීම සඳහා බඩු උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කළ විට එම භාණ්ඩය සොරකම් කරන ලද හෝ වෙනත් ආකාරයකින් නීති විරෝධී ලෙස ලබා ගන්නා ලද හෝ භාණ්ඩයක් බව සැක කිරීමට හේතු ඒ භාණ්ඩ උකස් ගන්නාට තිබේ ද,

එවිට, ඒ බඩු උකස් ගන්නා විසින් ඒ පිළිබඳව හැකිතාත් ඉක්මණින් පොලිස් නිලධරයකුට හෝ සාම නිලධරයකුට දැනුම් දිය යුතු ය. ඒ තැනැත්තා සහ ඒ භාණ්ඩය සම්බන්ධයෙන් නිසි පරිදි ක්‍රියා කිරීම සඳහා එම පොලිස් නිලධාරයා හෝ සාම නිලධාරයා විසින් අදාළ පොලිස් ස්ථානාධිපතිවරයා මගින් ඒ තැනැත්තා සහ ඒ භාණ්ඩය නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් ඉදිරියට නොපමාව ගෙන යා යුතු ය.

බඩු උකස් ගන්නාගේ පොත පරීක්ෂා කරනු ලැබීමට යටත් බව

37. යම් බඩු උකස් ගන්නෙකු වෙත භාර දෙනු ලබන නියමයක් මගින් පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ඒ නියමයේ නිශ්චිතව සඳහන් කර ඇති දිනයක දී සහ වේලාවක දී තමා ඉදිරියෙන් පෙනී සිටින ලෙසත්, ඒ බඩු උකස් කරන්නාගේ ව්‍යාපාරයට අදාළ සියළු පොත් සහ ලේඛන පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙසත්, ඒ බඩු උකස් ගන්නාට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

බඩු උකස් ගන්නෙකුගේ සාප්පු හෝ වාසස්ථාන සෝදිසි කිරීමේ බලය.

38. උප පොලිස් පරීක්ෂකයකුගේ නිලයට වඩා පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධරයකු හෝ ප්‍රධාන ලේකම්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධරයකු හෝ විසින් යම් බඩු උකස් ගන්නෙකුගේ හෝ ව්‍යාපාර ස්ථානයකට දිවා කාලයේ යම් වේලාවක දී ඇතුළු වී උකසට යටත්, යම් භාණ්ඩයක් හෝ ඔහු පවත්වාගෙන යන පොත්පත් හෝ ලියවිලි හෝ පරීක්ෂා කර අවශ්‍ය සටහන් ලියා ගැනීම නීත්‍යානුකූල වන්නේ ය. එවැනි යම් නිලධරයකු විසින් එම කාර්ය ඉටු කිරීමේදී කිසිදු තැනැත්තෙකු විසින් ඒ නිලධරයාට බාධාවක් නොකළ යුතු ය.

## IV වැනි කොටස

### වැරදි හා දණ්ඩන

උකස් කරන්නන් සහ වෙනත් තැනැත්තන් විසින් කරනු ලබන වැරදි

39. (අ) උකස් කිරීම සඳහා යම් බඩුවක් උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කරන එහෙත් තමාට එහි සන්තකය ලැබුණේ කෙසේද යන්න පිළිබඳව සතුටුදායක විස්තරයක් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ අපොහොසත් වන ; හෝ

(ආ) උකස් තැබීම සඳහා බඩු උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කරන බඩුවක් තමාගේම දේපළක් ද නැද්ද යන්න සම්බන්ධයෙන් හෝ තමාගේ නම හා ලිපිනය සම්බන්ධයෙන් හෝ ඕනෑකමින්ම අසත්‍ය තොරතුරු ඒ බඩු උකස් ගන්නා වෙත සපයන හෝ

(ඇ) යම් භාණ්ඩයක් නිදහස් කර ගැනීමට හිමිකම ඇති තැනැත්තෙකු නොවී එම භාණ්ඩය නිදහස් කර ගැනීමට උත්සාහ කරන හෝ වෑයම් කරන හෝ

(ඈ) වෙනත් තැනැත්තෙකුගේ දේපළක් නීත්‍යානුකූලව නිදහසට කරුණක් නොමැතිව බඩු උකස් ගන්නෙකු වෙත උකස් කරන ; හෝ

(ඉ) තමා සම්බන්ධයෙන් හෝ වෙනත් තැනැත්තෙකුගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් හෝ මේ ප්‍රඥප්තිය යටතේ යම් ප්‍රකාශයක් එහි ඇතුළත් යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය බව දැන දැනම ප්‍රකාශ කරන ; හෝ

(ඊ) මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් කඩ කරන හෝ කළ යුතු යැයි මේ ප්‍රඥප්තියෙන් තමන්ට නියමිත යම් දෙයක් කිරීම පැහැර හරින,

සෑම තැනැත්තෙක්ම වරදකට වරදකරු වන්නේ ය.

බඩු උකස් ගන්නන් විසින් කරනු ලබන වැරදි

40. (අ) වයස අවුරුදු දහඅටට අඩු හෝ බීමත්ව සිටින යම් තැනැත්තෙකුගෙන් යම් බඩුවක් උකස් ගන්නා

(ආ) උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව උකස්කරුට භාර නොදී බඩුවක් උකස් ගන්නා ; හෝ

(ඇ) වෙනත් බඩු උකස් ගන්නෙකු විසින් නිකුත් කරන ලද උකස් තුණ්ඩුවක මුල් පත්‍රිකාව මිලට ගන්නා හෝ උකස් ගන්නා හෝ හුවමාරු කරන ; හෝ

(ඈ) වයස අවුරුදු 18ට අඩු තැනැත්තකු බඩු උසස් කිරීම සඳහා සේවයෙහි යොදවන ; හෝ

(ඉ) තමා වෙත උකස් තර තිබෙන උකස් බඩුවක් මේ ප්‍රඥප්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියකදී හැර මිලට ගන්නා ; හෝ

(ඊ) තමා වෙත උකස්කර ඇති භාණ්ඩයක් තමා විසින් මිලදී ගැනීමේ අදහසින් නිදහස් කර ගැනීමට ඉඩ සලස්වන ; හෝ

(උ) තමා වෙත උකස් කරන හෝ උකස් කිරීමට ඉදිරිපත් කරන ලද යම් බඩුවක් එය නිදහස් කර ගැනීමේ කාලය තුළ දී මිලයට ගැනීමට, විකිණීමට හෝ බැහැර කිරීමට ඒ බඩු උකස්කරන නැතහොත් උකස් කිරීමට ඉදිරිපත් කරන තැනැත්තා සමග එකඟවන ; හෝ

(ඌ) තමා වෙත උකස් කරනු ලබන හෝ උකස් කිරීමට ඉදිරිපත් කරන යම් භාණ්ඩයක් එය නිදහස් කරගනු ලැබීමට ඉඩ දී ඇති කාලය තුළ දී මිලට ගැනීමට, විකිණීමට හෝ බැහැර කිරීමට යම් තැනැත්තෙකු සමග එකගත්වයට පැමිණෙන ; හෝ

(එ) තමා වෙත උකස් කොට ඇති යම් භාණ්ඩයක් මේ ප්‍රඥප්තියේ බලය දී ඇති ආකාරයට හැර විකුණන හෝ වෙනත් ආකාරයකින් බැහැර කරන ; හෝ

(ඒ) මේ ප්‍රඥප්තියෙන් නියමිත යම් පොතක අසත්‍ය සටහන් කරන හෝ නියමිත යම් සටහනක් ඇතුළත් කිරීම පැහැර හරින ; හෝ

(ඔ) තමා වෙත උකස් කර ඇති සියළුම භාණ්ඩවල සම්පූර්ණ වටිනාකම දක්වා තම ව්‍යාපාරය රක්ෂණයකින් ආවරණය කර ගැනීම පැහැර හරින ; හෝ

(ඕ) යම් විධිවිධානයක් කඩ කරන හෝ කළ යුතු යැයි මේ ප්‍රඥප්තියෙන් තමාට නියමිත යම් දෙයක් කිරීම පැහැර හරින ; හෝ

(ක) ප්‍රධාන ලේකම්වරයාගෙන් විධිමත් ලෙස බලපත්‍රයක් ලබා නොගෙන උකස් බඩු ගන්නා ව්‍යාපාරයක් පවත්වාගෙන යන,

සෑම බඩු උකස් ගන්නෙක්ම වරදකට වරදකරු වන්නේ ය.

රෙදිපිළි, ඇඳුම් සහ නොනිමි භාණ්ඩ ආදිය උකස් ගැනීම තහනම් බව

41. රෙදිපිළි, ඇඳුම් හෝ නොනිමි භාණ්ඩ හෝ ද්‍රව්‍ය කිසිවක් දැන දැනම උකස් ගන්නා සෑම බඩු උකස් ගන්නෙක්ම වරදකට වදරකරු වන්නේ ය. යම් අධිකරණයක් විසින් යම් බඩු උකස් ගන්නෙකු මේ වගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ විට එම වරද සඳහා ඒ අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අමතරව, ඒ භාණ්ඩය අධිකරණයේ දී හෝ අධිකරණය විසින් විධානය කරනු ලබන වෙනත් ආකාරයකට හෝ එහි අයිතිකරුට භාර දීම කළ යුතු ය.

උකස් කරන්නෙකුගේ බැරට ඇති මුදල්, පළාත් සභාවේ තැන්පත් කිරීම බඩු උකස් ගන්නකු විසින් පැහැර හරිනු ලැබූ විට

42. යම් උකස් කරුවකුගේ බැරට ඇති මුදල 31 වැනි වගන්තියෙන් හෝ 32 වැනි වගන්තියෙන් හෝ නියම කර ඇති ආකාරයට පළාත් සභා අරමුදලට තැන්පත් කිරීම පැහැර හරින සෑම බඩු උකස් ගන්නකුම යම් අධිකරණයක් විසින් එම වදරට වරදකරු කරනු ලැබූ විට, ඒ වරද සඳහා අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අමතරව, එකී මුදලට සමාන මුදලක් දඩයක් අයකර ගන්නා ආකාරයෙන් ඒ බඩු උකස් ගන්නාගෙන් අයකර ගැනීමට ඒ අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකිය. ඒ සෑම මුදලක් ම අධිකරණය විසින් අයකර ගනු ලැබූ කල්හි, එම මුදල උකස් කරන්නාගේ බැරට පළාත් සභා අරමුදලෙහි තැන්පත් කරනු ලැබිය යුතු ය.

බඩු උකස් ගන්නෙකුගේ සේවකයෙකු හෝ නියෝජිතයකු විසින් කරනු ලබන වැරදි

43. බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යාමේදී ඒ බඩු උකස් ගන්නාගේ සේවකයා හෝ නියෝජිතයා විසින් කරනු ලැබූ හෝ කිරීම පැහැර හරිනු ලැබූ හෝ යම් ක්‍රියාවක් අවස්ථාවෝචිත පරිදි ඒ බඩු උකස් ගන්නා විසින් කරනු ලැබූ හෝ කිරීම පැහැර හරිනු ලැබූ දෙයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

එසේ වුව ද, බඩු උකස් ගන්නෙකු ව්‍යාපාර ස්ථානයේ නොසිටිය දී ඒ බඩු උකස් ගන්නාගේ යම් සේවකයෙකු හෝ නියෝජිතයකු විසින් මේ ප්‍රඥප්තියේ විධිවිධානයන් කඩවන පරිදි යම් ක්‍රියාවක් කරන ලද්දේ නම් හෝ යම් ක්‍රියාවක් කිරීම පැහැර හරිනු ලද්දේ නම්, ඒ සේවකයා හෝ නියෝජිතයා වරකට වරදකරුවෙකු වන අතර, ඒ වරද සඳහා මේ ප්‍රඥප්තියෙන් නියම කර ඇති දණ්ඩනයකට ඔහු යටත් වන්නේ ය.

දණ්ඩන

44. මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන සෑම තැනැත්තෙකුම රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දෙකටම යටත් විය යුතු ය.

බඩු උකස් ගන්නෙකුගේ බලපත්‍රය අවලංගු කිරීම

45. බඩු උකස් ගන්නෙකු හෝ ඔහු නොසිටි අවස්ථාවක දී ඔහුගේ යම් සේවකයකු හෝ නියෝජිතයකු, මේ ප්‍රඥප්තිය යටතේ හෝ, ඔහුගේ ව්‍යාපාරයේදී කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් හෝ සොර බඩු බව දැන දැනම සොර බඩු සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, ප්‍රධාන ලේකම්වරයා විසින් ඒ බඩු උකස් ගන්නාගේ බලපත්‍රය අවලංගු කළ යුතු ය.

බඩු උකස් ගන්නෙකුගේ සන්තකයෙහි නීති විරෝධිව තබාගෙන ඇති බඩු

46. (1) යම් භාණ්ඩයක් යම් බඩු උකස් ගන්නෙකුගේ සන්තකයේ නීති විරෝධිව තබාගෙන ඇති බව මේ ප්‍රඥප්තිය යටතේ පවත්වාගෙන යනු ලබන යම් නඩු කටයුත්තකදී, යම් අධිකරණයකට පෙන්වා දෙනු ලබන කවර හෝ අවස්ථාවකදී ඒ භාණ්ඩය අධිකරණයට ඉදිරිපත් කරන ලෙස ද සුදුසු යැයි ඒ අධිකරණය විසින් සලකනු ලබන නියමයන් යටතේ කටයුතු සලස්වනු ලැබිය යුත්තේ ය.

වාර්ෂික ගිණුම් වාර්තාව

47. සෑම බඩු උකස් කරුවකු විසින්ම ස්වකීය ව්‍යාපාරය පිළිබඳව වාර්ෂික ගිණුම් වාර්තාවක් ප්‍රධාන ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

## V වැනි කොටස

### පරිපූරක විධිවිධාන

48. 31 වැනි වගන්තියේ සහ 32 වැනි වගන්තියේ විධිවිධාන අනුව යම් මුදලක් යම් උකස් කරන්නෙකුගේ බැරට ඇති අවස්ථාවක දී, ඒ පිළිබඳව උකස්කරු දැනුවත් කළ යුතු ය. ඒ මුදල එසේ තැන්පත් කරනු ලැබූ දින සිට අවුරුද්දක් ඇතුළත දී ප්‍රධාන ලේකම්වරයාගෙන් ඉල්ලූ විට, ඒ මුදල ලබා ගැනීමේ හිමිකම ඒ තැනැත්තාට ඇත. තවද අවුරුද්දක කාලය තුළ දී එවැනි ඉල්ලීමක් කරනු නොලැබුව හොත් ඒ මුදල පළාත් සභා අරමුදලට බැර කරනු ඇත. *උකස් කරන්නාගේ බැරට පළාත් සභාවේ තැන්පත් කර ඇති මුදල්*

49. බඩු උකස් ගන්නෙකු විසින් කළ යුතු යැයි මේ ප්‍රඥප්තියෙන් නියම කර ඇති හෝ කිරීමට මේ ප්‍රඥප්තියෙන් බලය දී ඇති යම් ක්‍රියාවක් ඔහුගේ සේවකයා හෝ නියෝජිතයා විසින් කරනු ලැබිය හැකි ය. *බඩු උකස් ගන්නෙකුගේ නියෝජිතයන් සේවකයන් ආදීහු*

50. යම් භාණ්ඩ යම් කොන්දේසි මත පසුව නිදහස් කර ගන්නා බවට හෝ ආපසු මිලදී ගන්නා බවට වූ ප්‍රකාශිත හෝ ව්‍යංගව එකඟ වීමක් හෝ පිළිගැනීමක් නැතහොත් ගණුදෙනුවේ ස්වරූපය හා ලක්ෂණ අනුව එවැනි එකඟවීමක් හෝ පිළිගැනීමක් ඇතැයි යුක්ති සහගතව සලකන විට, ඒ අනුව භාණ්ඩ මිලට ගැනීම හෝ විකිණීම සඳහා දෙනු ලබන අත්තිකාරම් මුදල් වලට ඇප වශයෙන් භාණ්ඩ තබා ගැනීම සඳහා ව්‍යාපාරයක් පවත්වාගෙන යමින් භාණ්ඩ මිලට ගෙන, භාරගෙන හෝ තබාගෙන ඒ වෙනුවෙන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවන්නා වූ හෝ අත්තිකාරම් වශයෙන් දෙන්නා වූ හෝ ණයට දෙන්නා වූ සෑම තැනැත්තෙකුම බඩුඋකස් ගැනීමේ ව්‍යාපාරය කරන්නෙකු ලෙස මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය. තවද ඒ හැම ගණුදෙනුවක්, භාණ්ඩයක්, ගෙවීමක්, අත්තිකාරමක් සහ ණයක්ම මේ ප්‍රඥප්තිය ඇතුළත පිළිවෙලින් උකසක් හෝ ණයක් ලෙස සලකනු ලැබිය යුතු ය. *ඇතැම් ව්‍යාපාරිකයන් බඩු උකස් ගන්නන් වශයෙන් සලකනු ලැබිය යුතු බව*

51. (1) නියෝග සෑදීමට මේ ප්‍රඥප්තියෙන් බලය දී ඇති හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ කාරණා සම්බන්ධයෙන් නියෝග හෝ අමාත්‍යවරයා විසින් කලින් කලට සෑදිය හැකි ය. *නියෝග*

(2) විශේෂයෙන්ම සහ, (1) වැනි උපවගන්තිය මඟින් පවරන ලද බලතල වල ව්‍යාප්තියට හානියක් නොමැතිව -

(අ) නියම කළ යුතු බවට මේ ප්‍රඥප්තියෙන් නියමිත යම් කරුණක් නියම කරමින් ; සහ

(ආ) බඩු උකස් ගන්නන් විසින් ඇප තබනු ලැබීමට ආනුශංගික වන යම් කරුණක් සඳහා විධිවිධාන සලස්වමින්,

අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් දිනයක සිට හෝ එහි නියෝග ක්‍රියාත්මක වන්නේ ය.

(4) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් පළාත් සභාවේ අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ ඉදිරිපත් කොට අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතියේ සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැළකිය යුතු වන නමුත් ඒ නියෝගය යටතේ ඊට කලින් කරනු ලැබූ යම් දෙයකට ඉන් අගතියක් සිදු නොවන්නේ ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලදැයි දන්වනු ලබන්නේ කවර දිනක සිට ද ඒ දිනය ගැසට් පත්‍ර මගින් නිවේදනය කරනු ලැබිය යුතු ය.

52. මේ ප්‍රඥප්තියේ සඳහන් බලතල කර්තව්‍ය හෝ කාර්ය කිසිවක් ප්‍රධාන ලේකම්වරයාගේ අත්සන යටතේ ලිඛිතව බලය දෙනු ලැබූ යම් රජයේ නිලධරයකු විසින් ක්‍රියාත්මක කරනු හෝ ඉටු කරනු ලැබිය හැකි ය. *මේ ප්‍රඥප්තිය යටතේ බලතල ආදිය පැවරීම*

53. මේ ප්‍රඥප්තියේ පැටහැනිව කුමක් සඳහන්ව ඇත් ද *අන්තර්කාලීන විධිවිධාන*

(අ) (99 වන අධිකාරය වූ) උකස් ආඥාපනත යටතේ දකුණු පළාත තුළ නිකත් කර ඇති යම් බලපත්‍රයක් මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් ලෙස සැළකිය යුතු ය.

(ආ) එම ආඥාපනත යටතේ සාදනු ලැබූ නියෝග කිසිවක් ඉවත් කොට මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබූ නියෝග ඒ වෙනුවට ආදේශ කරනු ලබන තෙක් එකී නියෝග මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබූ නියෝග ලෙස සැලකිය යුතු ය. තව ද,

(ඇ) ආඥාපනත යටතේ පවරනු ලැබ නියමිත දිනයට පෙරාතුව වූ දිනය වන විට විභාගයට පාත්‍රව පැවතියා වූ යම් නඩුවක් සහ එවැනි නඩුවක දී අධිකරණයක් විසින් දෙනු ලැබූ යම් තීරණයක් අවස්ථාවෝචිත පරිදි, මේ ප්‍රඥප්තිය යටතේ පවරන ලද නඩුවක් ලෙස ද, මේ ප්‍රඥප්තිය යටතේ පවරනු ලැබූ නඩුවක දී දෙන ලද තීරණයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපනය

54. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වූවහොත් මිස, මේ ප්‍රඥප්තියෙහි-

"නියමිත දිනය" යන්නෙන්, මේ ප්‍රඥප්තිය බලාත්මක වන දිනය අදහස් වේ.

"ව්‍යාපාර ස්ථානය" යන්නට, වාසස්ථානයක් හෝ ගුදමක්, ව්‍යාපාරික කටයුතු කරනු ලබන කවර හෝ ස්ථානයක් ඇතුළත් වේ.

"ප්‍රධාන ලේකම්වරයා" යන්නෙන්, දකණු පළාතේ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා හෝ ඔහු විසින් විධිමත්ව බලය පවරන ලද නිලධාරියකු හෝ නිලධාරීන් අදහස් වේ.

"ආණ්ඩුකාරවරයා" යන්නෙන්, දකුණු පළාත් ආණ්ඩුකාරවරයා අදහස් වේ.

"විදේශීය සමාගම" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනතේ XL වන කොටස අදාළ වන සමාගමක් අදහස් වේ.

"විදේශීය ව්‍යාපාර ආයතනය" යන්නෙන්-

(අ) හවුල්කරුවන් දෙදෙනෙකුගෙන් සමන්විත වූ ව්‍යාපාරයක් වන විට ඉන් එක් හවුල්කරුවකු හෝ හවුල්කරුවන් දෙදෙනාම හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන්නා වූ ව්‍යාපාර ආයතනයක් ; හෝ

(ආ) හවුල් කරුවන් දෙදෙනෙකුට වැඩි ගණනකින් සමන්විත වූ ව්‍යාපාරයක් වන විට, ඔවුන් යටත් පිරිසෙයින් එක් හවුල්කරුවකු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ව්‍යාපාර ආයතනයක්,

අදහස් වේ.

"මාසය" යන්නෙන්, ලාභ හෝ පොළී හෝ අයකිරීමේ කාර්යය සඳහා වූ විට, දින තිහක (30) කාල පරිච්ඡේදයක් අදහස් වේ.

"බඩු උකස්ගන්නා" යන්නට, භාණ්ඩ උකසට ගැනීමේ ව්‍යාපාරය පවත්වාගෙන යන නමුත් එම ව්‍යාපාරය කරන බැංකුවක් නොවන සෑම තැනැත්තෙකුම ඇතුළත් වේ.

"උකස් කරන්නා" යන්නෙන්, උකස් කිරීම සඳහා යම් බඩුවක් බඩු උකස් ගන්නෙකු වෙත භාර දෙන තැනැත්තෙක් අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන්, දකුණ පළාතේ පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන්, දකුණු පළාතේ පළාත් සභාව අදහස් වේ.

"පළාත් සභා අරමුදල" යන්නෙන්, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 වැනි වගන්තිය යටතේ ඇති කරන ලද දකුණු පළාත් සභා අරමුදල අදහස් වේ.

"නොනිමි භාණ්ඩ හෝ ද්‍රව්‍ය" යන්නට, භාණ්ඩ නැතහොත් ද්‍රව්‍ය කිසිවක් යම් නිෂ්පාදන ක්‍රියාවලියකට භාජනය කරනු ලැබීමෙන් පසු හෝ භාණ්ඩ නැතහොත් ද්‍රව්‍ය විෂයෙහි ඒවා යොදා ගනිමින් යම් නිෂ්පාදනමය ක්‍රියාවලියකට භාජනය කිරීමෙන් පසු ඇදීම හෝ පරිභෝජනය උදෙසා නිම කිරීමට ඒ භාණ්ඩ හෝ ද්‍රව්‍ය මිශ්‍ර හෝ වෙන වෙනම යම් නිෂ්පාදන තත්ත්වයක පවතී ද නැතහොත් යම් නිෂ්පාදනයක, කොටසක හෝ අංශයක නිෂ්පාදන වෙමින් පවතී ද, එවැනි භාණ්ඩ කිසිවක් ද භාණ්ඩ සැකසීම නැතහොත් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය කිසිවක් ද ඇතුළත් වේ.

(3 වන වගන්තිය)

**පළමුවන උපලේඛනය**

***බලපත්‍රය***

දකුණු පළාතේ ප්‍රධාන ලේකම්වන............................................................ නමැති මම, දකුණ පළාත් සභා සීමා තුළ ......................................................................... යන ස්ථානයෙහි බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යාමට........................................................පදිංචි .....................................................ට, දකුණු පළාත් සභාවේ අංක.........................................දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ, මෙයින් බලය දී බලපත්‍ර දෙමි.

මේ බලපත්‍රයේ කාලය..............................වන දින අවසන් වන්නේ ය.

....................
ප්‍රධාන ලේකම්.

(17 වන වගන්තිය)

**දෙවන උපලේඛනය**

***"අ" ආකෘතිය***

***උකස් බඩු පොත***

...................හි බඩු උකස්ගන්නා වන.......................ගේ උකස් භාණ්ඩ පොත

| උකස් තුණ්ඩුවේ අංකය හා එය නිකුත් කළ දිනය | මාසයේ උකස් බඩු අංකය | එක් එක් භාණ්ඩය සඳහා දුන් ණය මුදල | එක් එක් භාණ්ඩය සඳහා අය කළ ලාභ හෝ පොළී | උකස් කරන්නාගේ නම | උකස් කරන්නාගේ ලිපිනය | උකස් කරන්නා අයිතිකරු නොවන විට, අයිතිකරුගේ නම | උකස් කළ එක් එක් භාණ්ඩයේ විස්තර | උකස් කළ භාණ්ඩය ස්වර්ණාභරණයක් නම්, එහි බර | උකස් කළ එක් එක් භාණ්ඩයේ වටිනාකම | නිදහස් කර ගැනීමේ දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. | | | | | | රු. ශ. | |

(17 වන වගන්තිය)

**"අ" ආකෘතිය**

***උකස් භාණ්ඩ විකිණුම් පොත***

විකිණීම කළ දිනය හා ස්ථානය :....................................................................................

වෙන්දේසිකරුගේ නම හා ලිපිනය :.................................................................................

| උකස් භාණ්ඩ පොතේ දැක්වෙන අන්දමට උකස් බඩුවේ අංකය | උකස් කළ දිනය | උකස් කරන්නාගේ නම | ණය මුදලේ ප්‍රමාණය | අයවිය යුතු පොලී ප්‍රමාණය | වෙන්දේසිකරු විසින් එක් එක් උකස් භාණ්ඩය විකුණන ලද මුදල | මිළටගත් තැනැත්තාගේ නම හා ලිපිනය |
|---|---|---|---|---|---|---|
| | | | රු. ශ. | රු. ශ. | රු. ශ. | |

(18 වන වගන්තිය)

**"ඇ" ආකෘතිය**

***උකස් තුණ්ඩුව***

| | |
|---|---|
| උප පත්‍රිකාව, අංකය............... බඩු උකස් ගන්නා වෙත තබා ගත යුතු ය.<br><br>දිනය :...............<br><br>බඩු උකස් ගන්නාගේ නම හා ලිපිනය :<br><br>..........................................................................අංක<br>......................................දරන ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය දරන මෙහි පහත අත්සන් කරන (උකස් ගන්නාගේ ලිපිනය) ..................................................................පදිංචි වන මම ඉහත නම් සඳහන් බඩු උකස් ගන්නා වෙත රු. ................ක් වටිනා ..........................රු. .......................කට අද දින උකස් කළෙමි.<br><br>උකස් කරන්නාගේ අත්සන හෝ, නම ලිවීමට නොහැකි නම් ඔහුගේ වම් මාපට ඇඟිළි සළකුණ | මුල් පත්‍රිකා අංකය................<br>දිනය :................<br><br>.......................................................................................<br>(උකස් කරන්නාගේ නම සහ ලිපිනය)<br>විසින්, මෙහි පහත අත්සන් කරන..........................................<br>...............................(බඩු උකස් ගන්නාගේ නම සහ ලිපිනය)<br><br>වෙත රු....................................ක් වටිනා<br><br>............................රු. ...........................කට<br><br>අද දින උකස් කරන ලදී.<br><br>බඩු උකස් ගන්නාගේ හෝ ඔහුගේ සේවකයාගේ නැතහොත් නියෝජිතයාගේ අත්සන |

(22 වන වගන්තිය)

"ඈ" ආකෘතිය

*උකස් කරන්නාගේ අත්සනින් පිටසන් නොකරන ලද*
*උකස් තුණ්ඩුවක මුල් පත්‍රිකාව 22 වැනි වගන්තිය යටතේ*
*භාරදෙනු ලබන විට කළ යුතු ප්‍රකාශය*

පහත විස්තර කොට ඇති භාණ්ඩ/භාණ්ඩය ............................. විසින් බඩු උකස් ගන්නකු වන ......................... ගේ ව්‍යාපාර ස්ථානයේ දී උකස් තබන ලද බවත්, ඒ සඳහා වූ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව ලබාගෙන ඇති බවත්, එකී ............................ (උකස් කරන්නා) මිය ගොස් ඇති නිසා/................................ හේතු කොට ගෙන සිදු වී ඇති නෛතික අශක්නුතාවය යටතේ සිටින නිසා ඒ උකස් භාණ්ඩ බේරා ගැනීම සඳහා එකී .................................... (උකස් කරන්නාගේ) අත්සනින් එම උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව පිටසන් කරවා ගෙන ඉදිරිපත් කළ නොහැකි බවත් අංක ....................................... දරන ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය දරන................................ පදිංචි (ඒ. බී.) ................................................ වන මම බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව ගම්භීරතා පූර්වකවත් අවංකවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

ඉහත සඳහන් භාණ්ඩ/භාණ්ඩය....................................... වේ.

මෙහි ඉහත සඳහන් ප්‍රකාශය කරන තැනැත්තා....................................... පදිංචි .......................................... (ඒ. බී.) නමැති තැනැත්තා යැයි මා දන්නා බව ............................................. (සී. ඩී.) වන මම එකී ප්‍රඥප්තියේ විධිවිධාන අනුව ගම්භීරතා පූර්වකවත් අවංකවත් මෙයින් ප්‍රකාශ කරමි.

20..........................ක් වූ .................... මස .........................දින මා ඉදිරියේ දී ප්‍රකාශ කොට අත්සන් කරන ලදී.

("ඒ. බී." ගේ) අත්සන.................................
("සී. ඩී." ගේ) අත්සන................................

.........................................
සාමදාන විනිශ්චයකාරවරයා.

(24 වන වගන්තිය)

"ඉ" ආකෘතිය

*උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව නැතිවීම ආදියක දී කළ යුතු ප්‍රකාශය*

මෙම ප්‍රකාශය අසත්‍ය එකක් වුවහොත් මෙම ප්‍රකාශය කරන තැනැත්තාට දඬුවම් විඳීමට සිදුවන බව දැනගත යුතු ය.

බඩු උකස් ගන්නකු වන ........................................................................ ගේ ව්‍යාපාරික ස්ථානයේ දී පහත විස්තර කරන භාණ්ඩය/භාණ්ඩ............................................. විසින් උකස් කරන ලද බවත් ඒ සඳහා වූ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව ලබා ගන්නා ලද බවත් එම මුල් පත්‍රිකාව ඉන් පසු ..................................................අතින් ...........................................බවත් මුල් පත්‍රිකාව ........................................විසින් හෝ ........................................හෝ දැනුම හා විශ්වාසය අනුව කිසිවකුට විකුණා හෝ පවරා හෝ නැති බවත් අංක .............................................දරන ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය දරන්නා වූ ..................................................................පදිංචි (ඒ. බී.) ....................................වන මම බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාර ගම්භීරතා පූර්වකවත් අවංකවත් මෙයින් ප්‍රකාශ කරමි.

ඉහත සඳහන් භාණ්ඩය/භාණ්ඩ පිළිබඳ විස්තර පහත දැක්වේ.

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

මෙහි ඉහත සඳහන් ප්‍රකාශය කරන තැනැත්තා ..........................හි පදිංචි (ඒ. බී) ..........................නමැති තැනැත්තා යැයි මා දන්නා බව (සී. ඩී) ..........................වන මම එකී ආඥාපනතේ විධිවිධාන අනුව ගම්භීරතා පූර්වකවත් අවංකවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

20..........................ක් වූ .................... මස ..........................වන දින මා ඉදිරියේ දී ප්‍රකාශ කොට අත්සන් කරන ලදී.

("ඒ. බී." ගේ) අත්සන...................................
("සී. ඩී." ගේ) අත්සන...................................

..........................................
සාමදාන විනිශ්චයකාරවරයා.

(28 වන වගන්තිය)

"ඊ" ආකෘතිය

*ලදුපත*

දිනය :..........................

අංක ....................................දරන උකස් භාණ්ඩ නිදහස් කිරීමෙන් ලැබුණ

| | | රු. ශ. |
|---|---|---|
| ණය මුදල | ...................................... | ...................................... |
| ලාභය හෝ පොලිය | ...................................... | ...................................... |
| ව්‍යාපාර පිරිවැටුම් බද්ද | ...................................... | ...................................... |
| | එකතුව | ...................................... |
| | | ...................................... |

(28 වන වගන්තිය)

## තුන් වන උපලේඛනය

1. පොළී අනුප්‍රමාණ

ණය දෙනු ලබන සෑම රුපියල් දහසක් සඳහා පොළී අනු ප්‍රමාණය සෑම මාසයක් හෝ මාසයකින් කොටසක් සඳහා සියයට අටක් (8%) විය යුතු ය.

2. අදාළ බද්දක් ගෙවීම

උකස් භාණ්ඩයක් මත දෙනු ලබන ණයක් වෙනුවෙන් බඩු උකස් ගන්නන් යම් ලිඛිත නීතියක් යටතේ වූ බද්දක් ගෙවිය යුතු හෙයින්, ඒ අවස්ථාවක, එම බද්ද උකස් කරන්නාගෙන් අයකර ගත හැකිය.

3. වැඩිපුර පොළී අය කිරීම සීමා කිරීම

යම් දිනක සිට වැඩිපුර පොළියක් අයකර ගැනීමට බඩු උකස් ගන්නකුට හිමිකම් ඇති අවස්ථාවක දී, එදිනට පෙර උකස් බඩුව නිදහස් කර ගැනීමට තමාට නොහැකි වූයේ එදිනට පෙර දිනයෙහි පෙරවරු 8 සිට පස්වරු 8 දක්වා වූ කාලය තුළ ඒ බඩු උකස් ගන්නාගේ සාප්පුව වසා තිබුණ නිසා බව නිසි අධිකරණ බලය ඇති සිවිල් අධිකරණයක් සෑහීමට පත්වන අයුරු උකස් කරන්නා විසින් ඔප්පු කරනු ලැබුවහොත්, එවැනි වැඩිපුර පොළියක් අයකර ගැනීමට බඩු උකස් ගන්නාට හිමිකම නැත.

ඒ උකස් තුණ්ඩුවට අදාළ උකස් භාණ්ඩය, එය උකස් කළ දින සිට මාස දොළහක කාලයක් තුළ දී බේරා ගනු නොලැබුවහොත් ඒ උකස් භාණ්ඩය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබිය හැකි ය.

එසේ විකිණීමේ දී ලැබුණු යම් අතිරික්ත ලාභයක් වේ නම්, එය එකී විකිණීමේ දින සිට එක් අවුරුදු කාලයක් තුළ දී උකස් කරන්නා විසින් ඉල්ලා නොසිටිය හොත්, ඒ අතිරික්ත ලාභය ඒ උකස් කරන්නාගේ බැරට එක් අවුරුදු කාලයකට පළාත් සභාවේ තැන්පත් කරනු ලැබිය යුතු ය.

(29 වන වගන්තිය)

## හතරවන උපලේඛනය

### උකස් භාණ්ඩ වෙන්දේසි කිරීමට අදාළ නියෝග

1. වෙන්දේසි කරනු ලබන සියළුම උකස් භාණ්ඩ මහජනයා විසින් දැක බලා ගනු පිණිස වෙන්දේසිකරු විසින් විවෘතව තැබිය යුතු ය.

2. උකස් භාණ්ඩ සම්බන්ධයනේ පහත දැක්වෙන කරුණු ප්‍රකාශ කෙරෙන නාමාවලියක් වෙන්දේසිකරු විසින් ප්‍රසිද්ධ කළ යුතු ය.

   (අ) බඩු උකස් ගන්නාගේ නම සහ ව්‍යාපාරික ස්ථානය

   (ආ) ඒ උකස් භාණ්ඩය උකස් කළ මාසය

   (ඇ) එක් එක් උකස් භාණ්ඩය උකස් කරනු ලැබූ අවස්ථාවේ දී උකස් භාණ්ඩ පොතෙහි ඇතුළත් කරන ලද ආකාරයට ඒ එක් එක් උකස් භාණ්ඩ අංකය

03. එක් එක් බඩු උකස් ගන්නා වෙත ඇති උකස් භාණ්ඩය, ඒ නාමාවලියෙහි වෙනත් යම් බඩු උකස් ගන්නකුගේ උකස් භාණ්ඩ වලින් වෙන් කොට දැක්විය යුතු ය.

04. විකිණීම පිළිබඳ දැන්වීම වෙන්දේසිකරු විසින් යටත් පිරිසෙයින් එක් සිංහල, එක් දෙමළ සහ එක් ඉංග්‍රීසි පුවත්පතක බැගින් ප්‍රසිද්ධ කළ යුතු අතර විකිණීම කරනු ලබන ප්‍රදේශයේ මහජනයා ගැවසෙන ස්ථානවල ඒ දැන්වීම් ප්‍රදර්ශනය කළ යුතු ය. තවද, ඒ දැන්වීම්වල පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු ය.

(අ) බඩු උකස් ගන්නාගේ නම සහ ව්‍යාපාරික ස්ථානය, සහ

(ආ) ඒ උකස් භාණ්ඩය උකස් කරනු ලැබූ මාස

05. ඒ දැන්විම එකම පුවත්පතෙහි දින දෙකක් බැගින් පළ කළ යුතු අතර, දෙවන දින දැන්වීම පළ කළ යුත්තේ විකිණීම කරන පළමුවන දිනයට යටතේ පිරිසෙයින් පැහැදිලි දින දහයකට පෙර ය.

06. යම් විකිණීමක දී බඩු උකස් ගන්නා ලංසු තබන විට ඒ විකිණීමේ දී වෙනත් යම් තැනැත්තන් විසින් තබනු ලබන ලංසුවලට වඩා වෙනත් අන්දමකින් වෙන්දේසිකරු විසින් ඒ ලංසු ගැන සැළකිල්ලක් නොදැක්විය යුතු අතර, යම් භාණ්ඩයක් බඩු උකස් ගන්නා විසින් මිලදී ගනු ලැබූ විට, ඒ භාණ්ඩය මිළට ගත් තැනැත්තා වශයෙන් ඒ බඩු උකස් ගන්නාගේ නම වෙන්දේසිකරු විසින් නොපමාව හඬනගා ප්‍රකාශ කළ යුතු ය.

07. ඒ විකිණීමෙන් පසු දින දහහතරක් තුළ දී, ඒ නාමාවලියේ පිටපතක් හෝ ඒ බඩු උකස් ගන්නාගේ උකස් භාණ්ඩවලට අදාළ ඒ නාමාවලියේ කොටසේ පිටපතක්, ඒ බඩු උකස් ගන්නාගේ උකස් භාණ්ඩ විකුණූ මුදල් ප්‍රමාණය ඇතුළත් කොට වෙන්දේසිකරුගේ අත්සන යොදා සත්‍යායනය කොට ඒ බඩු උකස් කරන්නාට වෙන්දේසිකරු විසින් භාරදිය යුතු ය.

08. බඩු උකස් ගන්නා විසින්, ඒ වෙන්දේසියෙන් පසු යටත් අවුරුදු දෙකක කාලයක්, එවැනි සෑම නාමවලියක්ම සුරක්ෂිතව තබාගත යුතු ය.

12-278

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.